**THE EMBASSY OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA**
**TO BELGIUM, LUXEMBOURG AND THE EUROPEAN UNION**
**27, RUE JULES LEJEUNE, 1050 BRUSSELS, BELGIUM**
TEL: (0032.2) 344 53 94. (0032.2) 344 55 85 FAX: (0032.2) 344 67 37 E-MAIL: secretariat@srilankaembassy.be

## "උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිසම් වාර්තාව එළි දැක්වීම ශ්‍රී ලංකාව අපකීර්තියට පත් කිරීමට කටයුතු කරන මානව හිමිකම් සංවිධානයන්ට එල්ලවන අතුල්පහරකි"- තානාපති රවිනාථ ආයුෂ්සිංහ.

"උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිසම සිය වාර්තාව ඉදිරිපත් කිරීමට තව ඇත්තේ මසක කාලයක් පමණක් වන නමුත් එයට පෙරතුව යුරෝපා පාර්ලිමේන්තුවේ 'ශ්‍රී ලංකාවේ මරණයේ කෙත් බිම්' චිත්‍රපටය තිරගත කිරීමට යොදගැනීම ඉතාමත් පටු චේතනාවෙන් යුතුව සිදුකළ ක්‍රියාවක් බව බෙල්ජියමේ, ලක්සම්බර්ගයේ සහ යුරෝපා සංගමයේ ශ්‍රී ලංකා තානාපති රවිනාථ ආයුෂ්සිංහ මහතා පැවසීය. ''මෙය සඳහා අනුග්‍රාහකත්වය දක්වන ජාත්‍යන්තර ක්ෂමා සංවිධානය, හියුමන් රයිට් වොච් සහ ඉන්ටර්නැෂනල් ක්‍රයිසිස් ගෲප් යන සංවිධාන මෙම අවස්ථාව සංවිධානය කර ඇත්තේ එම වාර්තාව එළි දැක්වීම සමගින් ඔවුනට ශ්‍රී ලංකාවට පහර ගැසීමට ඇති තවත් අවස්ථාවක් අහිමිවී යාම'' හේතුවෙන් බවද හෙතෙම පැවසීය.

තානාපතිවරයා මෙම කරුණු පැවසුවේ 'ශ්‍රී ලංකාවේ මරණයේ කෙත් බිම්' චිත්‍රපටය පසුගිය බදාදා (2011 ඔක්තෝම්බර් 12) යුරෝපා පාර්ලිමේන්තුවේ තිරගත කිරීමෙන් පසු පැවති සාකච්ඡා සභාවේදී ශ්‍රී ලංකාවේ ස්ථාවරය පැහැදිලිකරමිනි. මෙම මානව හිමිකම් සංවිධාන ත්‍රිත්වය විසින් මෙම චිත්‍රපට දර්ශනය සංවිධානය කර තිබූ අතර මෙම චිත්‍රපටයේ අධ්‍යක්ෂ/නිෂ්පාදක මෙන්ම යුරෝපා පාර්ලිමේන්තු මන්ත්‍රීවරු කිහිපදෙනෙක්ද මෙම අවස්ථාව සඳහා රැස්ව සිටි පිරිස ඇමතූහ.

මන්ත්‍රීවරයෙකුගේ පෞද්ගලික මුල්පිරීමක් ලෙස යුරෝපා පාර්ලිමේන්තු පරිශ්‍රය මෙම කටයුත්ත සඳහා යොදගැනීම සම්බන්ධයෙන් සිය දැඩි විරෝධය පළ කළ තානාපති ආයුෂ්සිංහ මහතා තමා මෙම සිදුවීම යුරෝපා පාර්ලිමේන්තුවේ සභාපති ආචාර්ය ජේර්සි බූසෙක් මහතා වෙත දන්වා සිටි බවත්, එයට පිළිතුරු ලෙස ඔහුගේ කාර්යාලයය, මෙම අවස්ථාව ''පාර්ලිමේන්තුවේ සංවිධානය කරන අනෙකුත් බොහෝ රැස්වීම් සභා මෙන්, මෙය යුරෝපා පාර්ලිමේන්තුවේ නිල දේශපාලන අංශයක් විසින් සංවිධානය කරන ලද්දක් නොවන අතර එම හේතුවෙන් මෙය යුරෝපා පාර්ලිමේන්තුවේ හෝ එහි කිසියම් අනුගත ආයතනයක නිල ස්ථාවරය පිළිබිඹු නොකරන බව'' තමාට ස්ථිරව දැනුම්දුන් බවද පැවසීය.

''මෙම පෞද්ගලික රැස්වීම සභාව සංවිධානය කිරීමට මුල්වූ වගකිවයුත්තන් යුරෝපා පාර්ලිමේන්තුව එල්ටීටීඊයට ආවඩන්නන්ගේ වේදිකාවක් බවට පත් කරගැනීමට ඉඩ සළසාදී ඇති බව'' පැවසූ තානාපතිවරයා ''මෙවන් ක්‍රියාවන් තුළින් සිදුවන්නේ බටහිර රාජ්‍යයන්හි රැඳී සිටීමට උත්සාහ දරන එල්ටීටීඊයේ අවශේෂ පිරිස් තව තවත් ශක්තිමත් වීම බවත්, මෙවන් සිදුවීම් හරහා ලැබෙන ප්‍රචාරය ඔවුන් සිය අරමුදල් තරකිරීමට මෙන්ම සිය බඳවාගැනීමේ කටයුතු සීඝ්‍රකිරීමට මනාවූ ආයුධයක් ලෙස යොදගන්නා බවත්'' පෙන්වා දුන්නේය.

මෙම චිත්‍රපටය වෙත එල්ලවී ඇති චෝදනා සම්බන්ධයෙන්ද තානාපතිවරයා සවිස්තරාත්මක කරුණු පැහැදිලි කිරීමක් සිදුකළේය. මෙම චිත්‍රපටය සම්බන්ධයෙන් එල්ලවී ඇති ප්‍රධාන චෝදනාව ලෙස ඔහු දක්වා සිටියේ මෙම චිත්‍රපටයේ රූප රාමුවල යථාරූපීබව සම්බන්ධයෙන් පැන නැගී ඇති ගැටළු සමුදයයි. මෙම චිත්‍රපටය සඳහා යොදගෙන ඇති දර්ශනයන්ගේ අව්‍යාජත්වය සම්බන්ධයෙන් ගැටළු රැසක් පවතින අතරම, එහි අන්තර්ගතයේ කරුණු විකෘති කිරීම් සිදු කර ඇති බවද, එමගින් මෙම චිත්‍රපටයේ නිර්මාපකයින් ශ්‍රී ලංකා රජයට අභූත චෝදනා රැසක් එල්ල කරන බවද හෙතෙම පැහැදිලි කළේය. මෙවන් ක්‍රියාමගින් විවිධ ජාතීන් අතර ද්වේශයක් ජනනයවන

අතරම එමගින් වර්තමානයේ සිදුවන්නාවූ ප්‍රතිසංධාන කාර්යය අවදානමකට පත් කරන බව හෙතෙමෙ පෙන්වා දුන්නේය.

තානාපතිවරයා මෙහිදී ඉස්මතු කළ තවත් කරුණක් වූයේ මෙම චිත්‍රපටය හරහා ශ්‍රී ලංකාවේ ජනතාව, විශේෂයෙන් දමිළ ජනතාව, වසර 30කටත් අධික කාලයක් එල්ටීටීඊය හේතුවෙන් විඳි දුක්පීඩා සුළු කොට තකා ඇති බවයි. එල්ටීටීඊය යුරෝපා සංගමය විසින් තහනම් සංවිධානයක් බවට ප්‍රකාශයට පත් කර ඇති බවද හෙතෙම මෙහිදී අවධාරණය කළේය.

ත්‍රස්තවාදය අවසන්කර වසර දෙකක් තුළ ශ්‍රී ලංකාව ලඟාකරගෙන ඇති ධනාත්මක සංවර්ධනය ලොවෙහි අවධානයට ලක්වීම වලක්වා ශ්‍රී ලංකාව අපකීර්තියට පත්කිරීමට මෙම චිත්‍රපටය හරහා මෙය ප්‍රදර්ශනය සංවිධානය කළවුන් කටයුතු කර ඇති බවද ඔහු තවදුරටත් පෙන්වා දුන්නේය. ශ්‍රී ලංකාවේ විශේෂයෙන් උතුරු පළාතේ සිදුවී ඇති මෙම සංවර්ධනයන් විස්තර කළ හෙතෙම, මෙම කරුණු යුරෝපා පාර්ලිමේන්තුවේ ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් කටයුතු කරන්නාවූ 'දකුණු ආසියානු නියෝජිත මණ්ඩලය' විසින් සිය ශ්‍රී ලංකා සංචාරයට පසු පසුගිය ජූනි මාසයේදී ප්‍රකාශයට පත් කළ වාර්තාවෙන්ද සනාථකර ඇති බව පවසා සිටියේය. එසේම මෙම චිත්‍රපටය ප්‍රදර්ශනය හරහා සමහරක් යුරෝපා රාජ්‍යයන්හි පීඩන කණ්ඩායම්  සහ ඡන්ද ගොනු ලෙස ජීවත් වන ශ්‍රී ලාංකික දමිළ පිරිස්වල වුවමනාකම් ඉටු කිරීමට මෙහි සංවිධායකයන් කටයුතු කර ඇති බවටද ඔහු චෝදනා කළේය.

මෙම අවස්ථාවේදී ශ්‍රී ලංකා තානාපති කාර්යාලයය විසින් ශ්‍රී ලංකා රජය විසින් නිෂ්පාදිත 'මිත්‍යාවකට එකඟ වීම' වාර්තා චිත්‍රපටය සහ 'මානුෂීය මෙහෙයුම-යථා විශ්ලේෂණයක්' යන වාර්තාව රැස්වසිටි පිරිස අතර බෙදාහරින ලදී. ''මෙම වාර්තා පරිශීලනයෙන් පසු අසත්‍ය කරුණු ප්‍රචාරයන්ගෙන් වෙන්ව සත්‍ය වටහා ගැනීමට මෙහි රැස්ව සිටින පිරිසට හැකි වනු ඇති බවට'' තානාපති රවිනාථ ආර්යසිංහ මහතා සිය විශ්වාසය පළ කළේය.

ශ්‍රී ලංකා තානාපති කාර්යාලයය
බ්‍රසල්ස් නුවර

2011 ඔක්තෝම්බර් 12